සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

8 ශ්‍රේණිය **භූගෝල විද්‍යාව** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01 සෞරග්‍රහ මණ්ඩලය තුළ ඇති දර්ශනීයම ග්‍රහලෝකය ........................................ ය. (පෘථිවිය / සෙනසුරු / අඟහරු)

02 සූර්යයාගේ භ්‍රමණ කාලය පෘථිවි දින ........................................ කි. (25.4 / 365 / 28)

03 විශ්වය නිරීක්ෂණය සඳහා දුරදක්නය මුලින්ම භාවිතා කරන ලද්දේ ........................................ විසිනි. (ක්ලෝඩියස් ටොලමි / ජොහැන්නස් කෙප්ලර් / ගැලීලියෝ ගැලිලි)

04 දේශාංශ 180º ඔස්සේ රටවල් කැපී නොයන පරිදි ........................................ ලකුණුකර ඇත. (ග්‍රිනිච් රේඛාව / ජාත්‍යන්තර දින රේඛාව / සමකය)

05 දකුණු ආසියා කලාපයේ රටවල් අතර ........................................ ට මුහුදු තීරයක් හිමිව නොමැත. (නේපාලය / බංග්ලාදේශය / ශ්‍රී ලංකාව)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 සූර්යයා පෘථිවිය මෙන් 109 ගුණයක් පමණ විශාල ය. ( )

07 අභ්‍යන්තර ග්‍රහලෝක පාෂාණමය සංයුතියකින් යුක්තය. ( )

08 ක්‍රි.ව. 1957 දී ඇමරිකා එක්සත් ජනපදය මුලින්ම තොරතුරු ගවේෂණ චන්ද්‍රිකාවක් අභ්‍යවකාශ ගත කරන ලදී. ( )

09 දිවා රාත්‍රී ඇතිවීම පෘථිවි පරිභ්‍රමණයේ ප්‍රතිඵලයකි. ( )

10 ගංගා නම් ගඟ හින්දු බැතිමතුන්ගේ ශුද්ධ වූ නදිය වේ. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

11 සෞරග්‍රහ මණ්ඩලයේ මතුපිට උෂ්ණත්වය අධිකම ග්‍රහලෝකය ................................................................. වේ.

12 පෘථිවියේ ......................................................................... කාලය පැය 23 විනාඩි 56 කි.

13 පෘථිවි වායුගෝලයේ වායු සංයුතියෙන් 78.09% ක් ම ඇත්තේ ............................................................. වායුවයි.

14 පෘථිවිය වර්ග කිලෝමීටර් මිලියන ................................................................ ක් පමණ විශාල වූ ගෝලාකාර වස්තුවකි.

15 දේශාංශ $0^{o}$ රේඛාව එංගලන්තයේ ............................................................................. නගරය හරහා වැටී ඇත.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 සූර්යයාගේ මතුපිට සූර්ය කුණාටු ඇතිවන විට සිදුවන ක්‍රියාවලිය මින් කුමක් ද?

(1) තාපය ලබාදීම. (2) ගිනිදළු විහිදීම

(3) සුළඟක් ඇතිවීම. (4) අවට වායුව ගිනි ගැනීම.

17 සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතරින් අධිකතම ගුරුත්වාකර්ෂණ බලය ඇති ග්‍රහලෝකය කුමක් ද?

(1) අඟහරු (2) සිකුරු (3) සෙනසුරු (4) බ්‍රහස්පති

18 දේශාංශ පදනම් කරගනිමින් පෘථිවිය සම්මත කාල (වේලා) කලාප කීයකට බෙදා තිබේ ද?

(1) 04 (2) 15 (3) 24 (4) 360

19 දකුණු ආසියා සහයෝගීතා සංවිධානයේ සාමාජිකත්වය ලබා ඇති ඇෆ්ගනිස්ථානය භූගෝලීය වශයෙන් අයත් වන කලාපය මින් කුමක් ද?

(1) දකුණු ආසියාව (2) නැගෙනහිර ආසියාව

(3) ගිනිකොණදිග ආසියාව (4) මධ්‍යම ආසියාව


20 දකුණු ආසියා කලාපයේ ජනගහනය අධිකම රට මින් කුමක් ද?


(1) ඉන්දියාව (2) පාකිස්ථානය (3) බංග්ලාදේශය (4) චීනය

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

(01) (අ) පහත A සිට E දක්වා රූපවල දැක්වෙන ග්‍රහලෝක හා පුද්ගලයින් හඳුනාගෙන නම් කරන්න. (ල. 05)








A B C D E


(ආ) පහත දැක්වෙන ආදර්ශ ලෝක ගෝලයේ A සිට F දක්වා ඇති ප්‍රධාන අක්ෂාංශවලට අදාළ නම වරහන් තුළින් තෝරා ලියන්න.

(කර්කටක නිවර්තනය / උත්තර ධ්‍රැවය / සමකය / ඇන්ටාක්ටික් වෘත්තය / ආක්ටික් වෘත්තය / මකර නිවර්තනය)




(ල. 06)

(ඉ) පහත රූප සටහනේ දැක්වෙන පෘථිවි පරිභ්‍රමණය හා ඍතු ඇතිවන ආකාරය අනුව A සිට E දක්වා ඇති හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල. 05)



02 සෞරග්‍රහ මණ්ඩලය විවිධ අභ්‍යවකාශ වස්තූන්ගෙන් සමන්විත වේ.

(i) ග්‍රහලෝක යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද? (ල. 02)

(ii) (a) ග්‍රාහක වළල්ල පිහිටා ඇත්තේ කුමන ග්‍රහලෝක අතර ද? (ල. 01)

(b) තාරකා සහ ග්‍රහලෝක අතර පවතින වෙනස්කම් දෙක බැගින් වගුව තුළ දක්වන්න. (ල. 04)

| තාරකා | ග්‍රහලෝක |
|---|---|
| 1. | 3. |
| 2. | 4. |

(iii) (a) විද්‍යාඥයින් විසින් දැනට නම් කර ඇති වාමන ග්‍රහලෝක වලින් දෙකක් නම් කරන්න.

(b) එම වාමන ග්‍රහලෝකවල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 04)

03 දේශාංශ පදනම් කර ගනිමින් ලෝකයේ විවිධ ප්‍රදේශවල වේලාව ගණනය කරනු ලබයි.

(i) ග්‍රිනිච් වේලාව මධ්‍යාහ්න 12.00 සේ සලකා පහත සඳහන් වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| නගරය | පිහිටි දේශාංශය | භ්‍රමණයට ගතවන කාලය | එම නගරයන්හි වේලාව |
|---|---|---|---|
| ඩැකා | නැ.දේ. 90° | A. .......................... | ප.ව. 6.00 යි. |
| බුවනෝස් අයරස් | බ.දේ. 60° | පැය 4 යි. | B. .......................... |
| කොළඹ | C. .......................... | පැය 5 මිනිත්තු 20 | ප.ව. 5.20 යි. |

(ල. 06)

(ii) පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න. (ල. 02)

(iii) වේලා කලාප කිහිපයකට ඇතුළත් වන ලොව විශාල රටවල් තුනක් නම් කරන්න. (ල. 03)

04 පෘථිවි පරිභ්‍රමණයේ ප්‍රතිඵලයක් ලෙස සෘතු භේදය හටගනී.

(i) පහත පින්තූරවලින් දැක්වෙන සෘතු හඳුනාගෙන නම් කරන්න. (ල. 04)





(ii) උතුරු අර්ධ ගෝලයට හා දකුණු අර්ධගෝලයට එක් එක් සෘතුව උදාවෙන මාසය පහත වගුව තුළ දක්වන්න. (ල. 04)

| සෘතුව / අර්ධගෝලය | ගිම්හාන | සරත් | සිසිර | වසන්ත |
|---|---|---|---|---|
| උතුරු අර්ධගෝලය | 1. ............................ | සැප්තැම්බර් | 2. ............................ | මාර්තු |
| දකුණු අර්ධගෝලය | දෙසැම්බර් | 3. ............................ | ජූනි | 4. ............................ |

(iii) ඔබ ඉහත නම් කළ එක් සෘතුවක විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

05 (i) යාබදව දැක්වෙන දකුණු ආසියා සිතියමේ




(a) A වලින් දැක්වෙන කඳුවැටිය හා B වලින් දැක්වෙන කාන්තාරය නම් කරන්න.


(b) C හා D වලින් දැක්වෙන ගංගා දෙක නම් කරන්න. (ල. 04)


(ii) පහත (අ) තීරුවේ දකුණු ආසියාවට අයත් රටවල් කිහිපයක් ද, (ආ) තීරුවේ එම රටවල අගනගරද දැක්වේ. ඒ ඒ රටවල අගනගරයට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.


| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| 1. | බංග්ලාදේශය | (............) | A | නවදිල්ලිය |
| 2. | භූතානය | (............) | B | කත්මන්ඩු |
| 3. | මාලදිවයින | (............) | C | ඩැකා |
| 4. | ඉන්දියාව | (............) | D | තිම්පු |
| | | | E | මාලේ |

(ල. 04)

(iii) පහත දැක්වෙන ජාතික කොඩි අයත්වන දකුණු ආසියා රටවල්වල නම් අදාළ හිස්තැන මත ලියන්න.


A ...............................


B ...............................


C ...............................

(ල. 03)

06 (i) පෘථිවි වායුගෝලයේ බහුලව පවතින වායු වර්ග තුනක් නම් කරන්න. (ල. 03)


(ii) (a) පෘථිවි වායුගෝලයේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

(b) වායුගෝලය දූෂණයවීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 04)

(iii) (a) පෘථිවිය මත ජලය ව්‍යාප්තවී ඇති ප්‍රධාන ආකාර දෙකක් ලියන්න.

(b) ගෘහස්ථ පරිභෝජනයට අමතරව ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකක් නම් කරන්න. (ල. 04)

07 පහත දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




<u>හරහට</u>

1. රතු ග්‍රහයා නමින් හඳුන්වන ග්‍රහලෝකය
3. වාමන ග්‍රහයෙකි.
6. ඍතු හතරින් එකකි.
7. පෘථිවියේ උපග්‍රහයා මෙනමින් හඳුන්වයි.
8. ග්‍රහක වළල්ලෙන් පිටත පිහිටි ග්‍රහලෝක මෙනමින් හඳුන්වයි.
10. ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයකි.
11. ප්‍රධාන වී වගා කන්නයකි.

<u>පහළට</u>

2. ලොව විශාලම රට වේ.
4. වාෂ්පීකරණය හා උෂ්ණත්වය අධික ප්‍රදේශ
5. දවසේ එක් කාලයකි.
9. එවරස්ට් කන්ද පිහිටා ඇති කඳුවැටිය (ල. 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) සෙනසුරු (02) 25.4 (03) ගැලීලියෝ ගැලිලි (04) ජාත්‍යන්තර දින රේඛාව
(05) නේපාලය (06) ✓ (07) ✓ (08) × (09) × (10) ✓ (11) සිකුරු
(12) භ්‍රමණ (13) නයිට්‍රජන් (14) 510 (15) ග්‍රිනිච් (16) ගිනිදළු විහිදීම
(17) බ්‍රහස්පති (18) 24 (19) මධ්‍යම ආසියාව (20) ඉන්දියාව

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) A පෘථිවිය B බ්‍රහස්පති C සෙනසුරු D ගැලීලියෝ ගැලිලි
E නිල් ආම්ස්ට්‍රෝන් (ල. 05)

(ආ) A සමකය B කර්කටක නිවර්තනය C මකර නිවර්තනය
D ආක්ටික් වෘත්තය E ඇන්ටාක්ටික් වෘත්තය F උත්තර ධ්‍රැවය (ල. 06)

(ඉ) A වසන්ත විෂුවය B ජුනි 21 C සැප්තැම්බර් 23
D සිසිර නිවෘත්තිය E කක්ෂය (ල. 05)

02 (i) සූර්යා වටා කක්ෂ තල ඔස්සේ ගමන් කරන ගෝලාකාර වස්තූන් ග්‍රහලෝක වේ. (ල. 02)

(ii) (a) අඟහරු හා බ්‍රහස්පති අතර (ල. 01)
(ඉ) තාරකා - තමා විසින් ආලෝකය නිපදවයි / දීප්තිමත්ව බැබලේ / නිවී නිවී දැල්වේ
ග්‍රහලෝක - සූර්යයාගේ ආලෝකය පරාවර්තනය කරයි / දීප්තියෙන් අඩුයි / එක දිගට දැල්වේ (ල. 04)

(iii) (a) ප්ලූටෝ / එරිස් / මාකේ මාකේ / හෝමියා
(b) නිශ්චිත කක්ෂ මාර්ගයක් නොමැති වීම / ප්‍රමාණයෙන් කුඩා වීම / ගුරුත්වාකර්ෂණ බලය අඩු වීම (ල. 04)

03 (i) A පැය 6 යි. B පෙ.ව. 8.00 යි. C නැ.දේ. $80^{o}$ (ල. 06)

(ii) දිවා රාත්‍රී ඇතිවීම / ප්‍රාදේශීය වේලාවේ වෙනස්කම් සිදුවීම (ල. 02)

(iii) ඇමෙරිකා එක්සත් ජනපදය / රුසියාව/ ඕස්ට්‍රේලියාව / බ්‍රසීලය (ල. 03)

04 (i) A සරත් B සිසිර C වසන්ත D ගිම්හාන (ල. 04)

(ii) 1. ජුනි 2. දෙසැම්බර් 3. මාර්තු 4. සැප්තැම්බර් (ල. 04)

(iii) අදාළ පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න. (පෙළ පොත පිටු 24, 25) (ල. 03)

05 (i) A හිමාලය B තාර් කාන්තාරය C ගංගානම් ගඟ D ඉන්දු ගඟ (ල. 04)

(ii) 1. C 2. D 3. E 4. A (ල. 04)

(iii) A නේපාලය B පාකිස්ථානය C ඉන්දියාව (ල. 03)

06 (i) නයිට්‍රජන් / ඔක්සිජන් / ආගන් / කාබන්ඩයොක්සයිඩ් (ල. 03)

(ii) (a) ජීවයේ පැවැත්මට අවශ්‍යවීම / ජල චක්‍රයේ ක්‍රියාකාරීත්වයට / පෘථිවිය කරා එන අහිතකර කිරණ පාලනය කිරීම ආදී
(b) කර්මාන්තශාලාවලින් පිටවන දුම් / වාහනවලින් පිටවන දුම් / කසළ දිරාපත්වීමෙන් නිකුත්වන වායු වර්ග ආදී (ල. 04)

(iii) (a) සාගර හා මුහුදුවල / භූගත ජලය / අයිස් තට්ටු ලෙස / මිරිදිය ජලය
(b) කෘෂිකාර්මික කටයුතු / ජලවිදුලි උත්පාදනය / ප්‍රවාහන කටයුතු / විනෝද කටයුතු ආදී... (ල. 04)

07 <u>හරහට</u>

1. අඟහරු 3. හෝමියා 6. වසන්ත 7. සඳ 8. බාහිර
10. කරවල 11 යල

<u>පහළට</u>

2. රුසියාව 4. කාන්තාර 5. උදැසන 9. හිමාලය